# තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරන පනත් කෙටුම්පතක්

සමාජයේ දූෂණ වංචා අවම කිරීමේ අරමුණින් තොරතුරු දැන ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කෙරෙන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා තීරණය කර තිබේ.

තමන් නියෝජනය කරන ජාතික සංගමයේ මූලිකත්වයෙන් මෙයට අදාළ මූලික නීති කෙටුම්පත දැනටමත් සම්පාදනය කොට ඇති අමාත්‍යවරයා ඉතා ඉක්මණින් මහජන සංවාදයට එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන බව ප්‍රකාශ කළේය.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් නීති විශාරදයන් හා විද්වතුන් රැසකගේ දායකත්වයෙන් නව පනත් කෙටුම්පත සකස් කොට තිබේ. මේ ගැන ලංකාදීපයට අදහස් දැක්වූ මිලින්ද මොරගොඩ අමාත්‍යවරයා සඳහන් කළේ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේද සඳහන් වන තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කෙරෙන නීති කෙටුම්පත නව පාර්ලිමේන්තුවේ පළමු පනත් කෙටුම්පත ලෙස ඉදිරිපත් කිරීම සඳහා යෝජිත බවය.

යෝජිත පනත් කෙටුම්පත අනුව රජයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මහජනතාවට සෘජුව කරුණු විමසිය හැකි අතර සියලුම රජයේ ආයතන හා දෙපාර්තමේන්තු වල තොරතුරු නිලධරයකු පත් කිරීම ගැනද යෝජනා කර තිබේ.